# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2428/41 - 2025 මාර්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.:* කේඩීඑස්/ටීයූඑම්/4/1/6/2 .

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/7/2016/ එච්ඩබ්ලිව්/17.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 321 පුබ්බිලිය ග්‍රාම නිලධාරි වසමේ, පුබ්බිලිය ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ක. සි. අංක 321289හි, කලාප අංක 01, පත්‍ර අංක 1 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබල්ල.

**01. කැබලි අංක 1**

ඉඩමේ නම: බැබිලේගෙදරවත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පල්ලෙගෙදර නන්දාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1257.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 අප්‍රේල් මස 10 වැනි දින පෙ.ව. 10.00 ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2025 අප්‍රේල් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. එම්. එස්. එන්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2025 පෙබරවාරි මස 20 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0178